#mediaethicsSL #EnglishPress #lka #CeylonToday #November4

සෑමවිටම පුවත්පතක පළ කෙරෙනා තොරතුරු වල නිරවද්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා පුවත්පත හා ජනමාධ්‍යවේදීන් හා කතුවරුන් සාධාරණ ප්‍රයත්නයක් දැරිය යුතුය යන්න පිළිගත් මාධ්‍ය ආචාර ධර්මයකි. නමුත් ඇතැම් විට හිතාමතාම හෝ, එම සාධාරණ ප්‍රයත්නය නොදැරීම හේතුවෙන් හෝ එසේත් නැතිනම් අත්වැරදීම් නිසා හෝ ජනමාධ්‍ය ඔස්සේ සාවද්‍ය තොරතුරු පාඨකයා වෙත සන්නිවේදනය වේ.

මෙයට එක් උදාහරණයක් ලෙසින් නොවැම්බර් 04 දින සිලෝන් ටුඩේ පුවත්පතේ පළවූ මෙම ලිපිය දැක්විය හැක. මෙහි දක්වා ඇති ආකාරයට මුදල් මුද්‍රණය කිරීම ඉහළ ගොස් ඇති ප්‍රතිශතය සහ ප්‍රමාණය, එයට අදාළ මූලාශ්‍රය වන එම සතියේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සතිපතා ආර්ථික දර්ශකය හා සංසන්දනය කොට බැලූ විට එම දක්වා ඇති අගයයන් නිරවද්‍ය නොවන බව පෙනී යයි.

මෙවැනි නිරවද්‍යතාවය පිළිබඳ ගැටළුවක් ඇතිවී ඇත්තේ පුවත්පතට එම ලිපිය සඳහා නිවැරදි මූලාශ්‍ර ඔස්සේ තොරතුරු නොලැබුණු නිසාද? නැතිනම් මෙය හුදෙක් මිනිස් දෝෂයක්ද? එම කුමන කරුණක් යටතේ වුවත් මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවන්නේද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?